# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.09.30 පැය 0800 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1820 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. රැඳවුම් නියෝග ලබා සිටින සැකකරුවන් දෙදෙනෙකුගෙන් අනාවරණය වූ තොරතුරු මත අයිස් මත්ද්‍රව්‍ය, කේරළ ගංජා හා මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සොයා ගැනීමක් - කළුතර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2025.09.27 වන දින කළුතර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සිදු කරන ලද විමර්ශනයකින් පසු සංවිධානාත්මක අපරාධකරුවන් සමඟ සමීප සම්බන්ධතා පවත්වමින් මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම හා සංවිධානාත්මක අපරාධකරුවන්ට ආධාර අනුබල දුන් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන දොඩංගොඩ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර රැඳවුම් නියෝග ලබා ගෙන ඇත.

සැකකරුවන් සම්බන්ධයෙන් සිදු කරන ලද වැඩිදුර විමර්ශනයේදී මෙරට නිෂ්පාදිත බෝර 12 වර්ගයේ ගිනි අවියක්, එම පතරොම් 02 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 25 ක්, මත්ද්‍රව්‍ය ප්‍රවාහනයට යොදා ගත් යතුරුපැදියක්, යතුරුපැදි අංක තහඩු 04 ක්, ආදායම් බලපත්‍ර 02 ක් හා රක්ෂණ සහතික 02 ක් සොයා ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 24 හා 30 යන වයස්වල පසුවන කළුතර දකුණ හා බෝම්බුවල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

දොඩංගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. රන්මාල හා දේපල කොල්ලකෑම් රැසකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු හෙරොයින් සමඟ අත්අඩංගුවට හා කොල්ලකෑ සොරබඩු බැහැර කල සැකකරුවෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - කැළණිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2025.09.29 වන දින කැළණිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් පැලියගොඩ පොලිස් වසමේ බකිණිගහපිල්ලෑව පාලම අසලදී වැටලීමක් සිදු කර හෙරොයින් ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 500 ක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 29 ක් වන කොළොන්නාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු සම්බන්ධයෙන් සිදු කරන ලද වැඩිදුර විමර්ශනයේදී වැල්ලම්පිටිය පොලිස් ස්ථානයට වාර්තා වූ රන් භාණ්ඩ හා මුදල් කොල්ලකෑම් රැසකට අවශ්‍ය කර සිටි

සැකකරුවෙකු බවට අනාවරණය වී ඇති අතර සැකකරුගෙන් සිදු කරන ලද වැඩිදුර ප්‍රශ්ණ කිරීමෙන් අනතුරුව සොරබඩු බැහැර කල සැකකාරියක් හා සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකාරිය අවුරුදු 45 ක් වන කොළොන්නාව ප්‍රදේශයේ පදිංචිකාරියක් වන අතර සැකකරු වයස අවුරුදු 44 ක් වන වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සොරකම් කරන ලද කරාබු ජෝඩුවක් පොලිසිය විසින් සොයා ගෙන ඇති අතර අත්අඩංගුවට ගත් සැකකරුවන් දෙදෙනා හා සැකකාරිය වැඩිදුර විමර්ශන සඳහා පැලියගොඩ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

පැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

**03. තීරුබදු නොගෙවා මෙරටට රැගෙන එන ලද විදේශීය මත්පැන් බෝතල් 75 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ ගුවන්තොටුපල ඒකකය.**

2025.09.30 වන අද දින අළුයම් කාලයේ කටුනායක ගුවන්තොටුපල පැමිණීමේ පර්යන්තයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර තීරුබදු නොගෙවා මෙරටට රැගෙන එන ලද විදේශීය මත්පැන් බෝතල් 75 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 38 ක් වන මන්නාරම පාර, විලුක ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ ගුවන්තොටුපල ඒකකය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. තීරුබදු රහිතව මෙරටට ගෙන්වන ලද නීති විරෝධී දුම්වැටි සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2025.09.29 වන දින දහවල් කාලයේ මෝදර පොලිස් වසමේ වරාය අසලදී කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර තීරුබදු රහිතව මෙරටට රැගෙන එන ලද නීති විරෝධී දුම්වැටි 9200 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන මෝදර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරුවන් අවුරුදු 21 හා 50 යන වයස්වල පසුවන කතරගම හා බිලූමැන්ඩල් ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මෝදර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**